# භාෂාව හා යථාර්ථය

ගලෑඩ රත්නාලෝක හිමි[1]

## හැඳින්වීම

දර්ශනය විෂය ක්ෂේත්‍රය තුළ සාකච්ඡාවන බොහෝ සංකල්පයන් අතර ඉතා වැදගත් සංකල්ප ද්විත්වයක් වශයෙන් භාෂාව හා යථාර්ථය හඳුනාගත හැකිය. මානව පරිණාමයේ යම් සන්ධිස්ථානයක මානවයා සිතීම ආරම්භ කළේ ද එදා සිට වර්ධනය වූ භාෂාවත් ලෝකයේ යථාර්ථය මෙන්ම සමස්තයේ යථාර්ථය කුමක් ද යන්න විමසීමත් වර්තමානය අතික්‍රමණය කරමින් අනාගතය දක්වාද දිවයන්නකි. එබැවින් මෙය දර්ශනය විෂය ක්ෂේත්‍රය තුළ බරපතළව සාකච්ඡාවන ප්‍රධාන මාතෘකාවක් වශයෙන් හඳුන්වාදිය හැකිය.

යථාර්ථය හා භාෂාව අතර පවතින සබඳතාවය කෙබඳු වූවක් ද? එහි යම් සම්බන්ධයක් පවති ද? එකිනෙකට වියුක්ත වූවක් ද? යථාර්ථය භාෂාවේ නිර්මිතයක් ද? නැතිනම් සම්මුතික වශයෙන් ගොඩ නැගෙන්නක් ද? මෙවැනි බොහෝ ගැටලු භාෂාව හා යථාර්ථය පිළිබඳ විමසිය හැකිය. නමුත් මෙම ප්‍රස්තුතයේ අරමුණ වන්නේ යථාර්ථය භාෂාවේ නිරූපණයක් ද? නැතිනම් සම්මුතික වශයෙන් ගොඩ නැගෙන්නක් ද? යන්න දාර්ශනික විමර්ශනයකට යොමු කිරීමයි. එහිදි ප්‍රථමව භාෂාව හා යථාර්ථය පිළිබඳ වෙන වෙනම දළ අවබෝධයක් ලබා ගැනීම උචිත වේ.

## භාෂාව

භාෂාව කවදා කෙලෙස ආරම්භ වූයේ දැයි කිසිවෙකු නිශ්චිත වශයෙන් ප්‍රකාශ නොකරයි. එය අතීතයට අයත් වන්නක් බැවිනි. මානවයා පරිණාමය වීමත් සමඟ සියල්ල ම විපරිණාමයකට පත් වූ බව මාක්ස්වාදීන් දක්වන අදහසට අනුව භාෂාව ද මෙසේ ගොඩ නැගුණකි. එනම් මිනිසා තම අදහස් හා සංකල්පයන් අනිකා සමඟ බෙදා ගැනීමට ගත් උත්සහයක ප්‍රතිඵලයක් වශයෙන් භාෂාව බිහි වූ බවයි.

භාෂාව වශයෙන් අප හඳුනා ගන්නේ කුමක් ද? මිනිසාට භාෂාවක් අවශ්‍ය වූයේ ඇයි? භාෂාවෙන් වියුක්ත මානවයාගේ පැවැත්ම කෙබඳු වේද? මෙවැනි ප්‍රශ්න රාශියක් භාෂාව සම්බන්ධව ගොඩ නැගිය හැකිය.

---

[1] දර්ශනය අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය

භාෂාව වශයෙන් අප හඳුනා ගන්නේ යම් සංකේත සමූහයකි. මෙම සංඛේත ඒ ඒ ජනවර්ගය, සමාජයට අනුව වෙනස් වේ. සිංහල භාෂාව භාවිත කරන ලාංකිකයා එය වෘත්තයක, ඉලිප්සීය හැඩයකින් සංකේතවත් කරයි. මෙය ද අතීතයේ සිට ක්‍රමික විකාශයක ප්‍රතිපලයකි. අතීතයේ දී එම සංඛේත පැවති ආකායට ගෝලාකාර නොවීය. එසේම එකම හැඩතලයක් ද නොවීය. ක්‍රමික විකාශය සමඟ වර්ථමානයේ අප භාවිත කරන සිංහල භාෂාව උක්ත සඳහන් අයුරින් දිස්වේ. මීට අමතරව ලොව බොහෝ ජනයා භාවිත කරන ඉංග්‍රීසි භාෂාවට ද එක්කරා අයුරක හැඩයක් තිබේ. එසේම චීන, ජපන්, කොරියන් වැනි භාෂාවන් එක්තරා ආකාරයක මෝස්තරයක් මෙනි. ඒවායේ තනි සංකේතයකින් විසල් අර්ථයක් ද ගම්‍ය කරයි. මෙයින් ගම්‍ය වන්නේ කුදුමහත් සමාජයට ම පොදු වූ එක් සංකේත කරනයක් භාෂාව තුළ නොමැති බවයි.

මානවයාට භාෂාවක් අවශ්‍ය වූයේ ඇයි? ලේඛන කලාව ආරම්භ වීමට පෙර මිනිසා තම අදහස්, පණිවුඩ, අණපනත් ආදිය වාචිකව සමාජ ගත කළ බව ඉතිහාසය සාක්ෂ්‍ය දරයි.ලේඛන කලාව ආරම්භයත් සමඟ තම අරමුණු ඉටුකර ගැනීම සඳහා භාෂාව යොදා ගන්නා ලදි. භාෂාවක් නොමැති මානවයා තම අදහස, අරමුණ අනිකාට දැක්වීම සඳහා අභිරූපණ යොදා ගන්නට යෙදුණි. එය කථන දෝෂයෙන් පෙළෙන දරුවකු මෙනි. එනම් ගොළු දරුවන් තම අදහස මවට, පියාට හෝ තම හිතවතුනට පවසන්නේ අභිරූපන මඟිනි. ශරීරය භාවිත කරමින් සිදු කරන ක්‍රියාවන් වේ. එය වඩාත් තීව්‍රවූ විට අ........ ඈ....... උ........ හැ......... ඔඕ........ වැනි ශබ්ද ස්මතු වේ. මේ අනුව අතීත මුතුන්මිත්තන් ද පළමුව අභිරූපණ මඟින් ද පසුව ක්‍රමයෙන් තම සමාජය තුළ සම්මත කරගත් සංකේත, අර්ථ මඟින් ද තම අදහස් හුවමාරු කරගන්නට ඇත.

භාෂාවෙන් වියුක්ත මානවයාගේ පැවැත්ම කෙබඳු වේද? යන්න ද විමසීම වටී. වර්තමාන ජන ජීවිතයත් සමඟ සමාජගත මිනිසාට භාෂාවෙන් වියුක්තව ක්‍රියා කළ නොහැකි බව අසත්‍යක් නොවේ. සාක්ෂරතාවය මැනීම වර්තමානය වන විට ලෝකයේ ම ගැටලුවක් බවට හා ක්‍රමයක් බවට පත් වී තිබේ. එමගින් උගත් නූගත් බව තීරණය කරන්නට ද නවීන මානවයා පෙළඹී ඇත. ඒනයින් බලන කළ අතීත මිනිසා නූගත් මිනිසෙකි.

මේ අයුරින් සාකච්ඡාවන භාෂාව මඟින් යථාර්ථය නිරූපණය කරනු ලැබේ ද? යන්න විමසීම මෙහි ප්‍රධානම අපේක්ෂාව වේ.

යථාර්ථය

යථාර්ථය යනුවෙන් අප සාකච්ඡා කරනු ලබන්නේ කුමක් ද? එය සැමට පිළිගත හැකි ද? මේ සඳහා තිබෙන පිළිතුර නම් යථාර්ථය යනු සැමට පොදුවේ පිළිගත හැකි දෙය යන්නයි.යථාර්ථය පිළිබඳ ගවේෂණය ආරම්භ වන්නේ ඈත අතීතයේ දීය. මෙය පෙර අපර දෙදිගම සාකච්ඡාවට බඳුන් කළ සංකල්පයකි.

පෙරදිග දර්ශනය තුළ යථාර්ථය පිළිබඳ සාකච්ඡාව ආරම්භ වී ඇත්තේ වෛදික දාර්ශනික යුගයේ දී බව වෛදික ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් අවබෝධ කරගත හැකිය.එහිදී මහාබ්‍රහ්ම සංකල්පය තුළින් යථාර්ථය ඉස්මතුකොට දැක්වීමට වෛදික දාර්ශනිකයා උත්සාහගෙන තිබේ. ඉන් අනතුරුව උපනිෂද් දර්ශන යුගයේ දී බ්‍රහ්මන් හා ආත්මන් යන සංකල්ප ද්විත්වය මඟින් තමා පිළිබඳ යථාර්ථය හා බාහිර ලෝකය පිළිබඳ යථාර්ථය ඉදිරිපත් කොට තිබේ. උපනිෂද් දර්ශනයෙන් පසුව වර්ධනය වන බෞද්ධ, ජෛන, සාංඛ්‍ය, යෝග, න්‍යාය, වෛශේෂික, මීමංසා, වේදාන්ත ආදි දර්ශන පද්ධති තුළ ද යථාර්ථය පිළිබඳ සාකච්ඡාව සිදුකොට ඇති බව එම දර්ශන පද්ධති අධ්‍යයනයෙන් ගම්‍ය කරගත හැකිය.

අපරදිග දර්ශනය තුළ යථාර්ථය පිළිබඳ සාකච්ඡාව ආරම්භ වන්නේ බටහිර දර්ශනයේ ආරම්භක දාර්ශනිකයා වශයෙන් හැඳින්වෙන තේල්ස් ගෙනි. ඔහු නඟන ප්‍රශ්නය ඍජුවම යථාර්ථය සමඟ සම්බන්ධ වේ. එනම් 'පැටලිලි සහිත ලෝකයේ පැටලිලි රහිත යථාර්ථය කුමක් ද?' යන්නයි.ඒ අනුව ග්‍රීක දාර්ශනිකයෝ තම සාකච්ඡාවන් තුළ විශේෂයෙන් ම යථාර්ථය පිළිබඳ ගවේෂණය කිරීමට අමතක නොකළ බව පෙනේ.

අපරදිග යථාර්ථය පිළිබඳ සංකල්පය භෞතිකම ස්වරූපයෙන් ඉදිරිපත් කොට තිබේ. නමුත් පෙරදිග යථාර්ථය වැඩි වශයෙන් අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වෙත යොමු වේ. අපරදිග සම්භාව්‍ය ග්‍රීක දාර්ශනික ප්ලේටෝ අධිභෞතික සංකල්පයක් තුළින් එය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයක් බවට පෙරළයි. එනම් ආකෘතික ලෝකය හා ප්‍රපංච ලෝකය වශයෙන් ලෝකයන් ද්විත්වයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් කිරීමෙනි. ඉන් අනතුරුව ගොඩ නැගෙන මධ්‍යයතන දාර්ශනික යුගයේ දී දෙවියන් වහන්සේ ප්‍රධාන කරගත් දර්ශනයක් ගොඩ නැගුණු අතර විශ්වාසය මඟින් යථාර්ථය අවබෝධ කරගත හැකි බව එහි මූලික අදහස විය.

නූතන යුගයේ දී රේනේ ඩේකාට්, බෙනඩික්ට් ස්පිනෝසා හා ලයිබ්නිස් යන බුද්ධිවාදි දාර්ශනිකයෝ බුද්ධිගෝචර වශයෙන් යථාර්ථය ගොඩනැගෙන බව පිළිගත් අතර ජෝන් ලොක්, ජෝර්ජ් බර්ක්ලේ හා ඩේවිඩ් හ්‍යුම් යන අනුභූතිවාදි දාර්ශනිකයෝ අනුභූතිමය වශයෙන් යථාර්ථය සපර්ෂ කළ හැකි බව

පිළිගත්හ.සමකාලීන දාර්ශනික යුගයේ දී යථාර්ථය හා භාෂාව පිළිබඳ සාකච්ඡාව උච්චතම අවස්ථාවට පැමිණියේ ය.

**සමාලෝචනය**

මේ ආකාරයට පැහැදිලි වන භාෂාව හා යථාර්ථය අතර පවතින සබඳතාවය කෙබඳු වේද? යන්න අපගේ ප්‍රධානම ප්‍රස්තුතයයි. ඒ අනුව යථාර්ථය භාෂාවේ නිරූපණයක් ද? නැතහොත් සම්මුතියක් වශයෙන් ගොඩ නැගෙන්නක් ද? මේ බව අපරදිග සමකාලීන දාර්ශනික යුගයේ විශ්ලේෂී දාර්ශනික ලුඩ්විග් විට්ගන්ස්ටෙන් හා බට්‍රන්ඩ් රසල් යන දාර්ශනිකයින් දෙදෙනාගේ මතවාදයන් හා පෙරදිග බෞද්ධ දර්ශනය තුලනය කිරීම තුළින් යම් අදහසක් ගම්‍ය කර ගත හැකිය.

සමකාලීන දාර්ශනික යුගය තුළ යථාර්ථය පිළිබඳ සාකච්ඡාව අපගේ ප්‍රස්තුතයට උචිතවන අයුරින් ඉදිරිපත් කොට තිබේ. එනම් යථාර්ථය භාෂාව මඟින් නිරූපණය කරන බව ඉදිරිපත් වීම තුළිණි. සමකාලීන දාර්ශනික යුගයේ බර්ට්‍රන්ඩ් රසල් හා ලුඩ්විග් විට්ගන්ස්ටෙන් යන දාර්ශනිකයින් දෙදෙනා භාෂාව පදනම් කරගෙන අර්ථය (meaning) හා යථාර්ථය (reality) පිළිබඳ තම විමර්ශනයන් ඉදිරිපත් කොට තිබේ.

මෙහිදි ප්‍රධාන වශයෙන්ම අපගේ අවධානය යොමු වන්නේ විට්ගන්ස්ටෙන් වෙතය. ඔහු තම ට්‍රැක්ටේටස් ලෝජිකෝ ෆිලෝසොෆිකස් *(Tractatus Logico-Philosophicas)* නම් කෘතිය මඟින් යථාර්ථය හා භාෂාව අතර පවතින සබඳතාවය මැනවින් විග්‍රහකොට තිබේ. විට්ගන්ස්ටෙනියානු දර්ශනයට අනුව පැහැදිලි වන්නේ යථාර්ථය යනු භාෂාවේ නිරූපණයක් බවයි. අප යමක් ප්‍රකාශ කරන්නේ ද එයට අදාළව දෙයක් භෞතිකව නිරූපණය වන බවයි. එසේ නොවන යමක් ලොව පැවතිය නොහැකි බව හා යථාර්ථය වශයෙන් පිළිගත නොහැකි බව එම දර්ශනයෙන් ඉදිරිපත් වේ.

නමුත් බෞද්ධ දර්ශනය තුළ යථාර්ථය පිළිබඳ අදහසසම්මුති වශයෙන් හා පරමාර්ථ වශයෙන් සාකච්ඡා වේ. එනම් යථාර්ථය සම්මුති වශයෙන් ගොඩ නගා ගන්නක් බව හා පරමාර්ථ වශයෙන් පවතින්නක් වන බවයි. මහාභූත ධර්මයන් පදනම් කරගෙන ගොඩ නැගී ඇති වස්තූන්ට විවිධ නාමයන් දී අපි ඒවා භාවිත කරන බව බෞද්ධ දර්ශනයේ පැහැදිලි කිරීමයි. ඒ අනුව යථාර්ථය වශයෙන් අප සාකච්ඡා කරන සෑම දෙයම සම්මුති වශයෙන් ගොඩ නගා ගත් දේවල් බව පැහැදිලිය.

නමුත් විට්ගන්ස්ටෛනියානු දර්ශනයට අනුව භාෂාව මඟින් යථාර්ථය නිරූපණය වේ. අපි යමක් ප්‍රකාශ කරන්නේ ඒ පිළිබඳ අප තුළ දැනීමක් තිබේ නම් පමණි. භාෂාව පිළිබඳ අපගේ දැනුම කෙතරම් ද ලෝකය යනු එපමණක් බව විට්ගන්ස්ටෛනියානු දර්ශනයේ පැහැදිලි කොට තිබේ.භාෂා උපයෝගයෙන් අපි යමක් ප්‍රකාශ කරන්නේ ද එවිට එම ප්‍රකාශයට අදාළව යමක් ලෝකයේ නිරූපණය නොවන්නේ ද එවිට එය අධිභෞතික සංකල්පයක් වන අතර එය අසත්‍යය ද වෙයි. එනම් නිරූපිත යමක් නැති නිසාය.

මේ අනුව මෙම දාර්ශනික පද්ධති ද්විත්වයටම අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ සම්මුතික වශයෙන් පවතින යථාර්ථය භාෂාව මඟින් නිරූපණය කරනු ලබන බවයි. එනම් අපි භාෂාව මඟින් යමක් ප්‍රකාශ කරන්නේ ද එය මානසික වශයෙන් අපගේ ආධ්‍යාත්මයේ පවති. භාෂාත්මක වචනය ශ්‍රවනය වීම තුළින් එයට අදාළවන සංවේදනය සංජානනය වේ. එය යථාර්ථය වශයෙන් පිළිගැනිමට අප එකඟ වී සිටි.

ප්‍රමුඛ පද : භාෂාව, යථාර්තය, බෞද්ධ දර්ශනය, විට්ගන්ස්ටෛන්, සම්මුතිය

## ආශ්‍රිත ග්‍රන්ථ

කලන්සූරිය, ඒ.ඩී.පී. (1964). *ග්‍රීක දර්ශනය.* වරකාපොල: ආරිය ප්‍රකාශන.

ජයතිලක, කේ. (2005), *දර්ශනවාද අසබඩින්.* කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

විදානගමගේ, කුලසේන, (1993). *සමකාලීන භාෂාමය දර්ශනය-ලුඩ්විග් විට්ගනස්ටෛන්.* කර්තෘ ප්‍රකාශනයකි.

Wittgenstein, Ludwig. (1961)' *TRACTATUS LOGICO-PHILOSOPHICUS,* (Translate By) D.F. Pears &B.F. McGuinness, London: Routledge & Kegan Paul.

*දර්ශන අධ්‍යයන.* දර්ශනපති හෝමාගම ධම්මානන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය කලාපය. වාද්දුව: ප්‍රවචනෝදය පිරිවෙන.